ලේඛනාගාරය
මැතිවරණ මහ ලේකම් කාර්යාලය
රාජගිරිය

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත

---

[සහතිකය සටහන් කළේ 1980 ඔක්තෝබර් මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 ඔක්තෝබර් මස 31 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 21.00 යි. කැපැල් ගාස්තුව : රු. 7.50 යි.

# 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත

[සහතිකය සටහන් කළේ 1980 ඔක්තෝබර් මස 24 වන දින]

එල්.ඩී.—ඕ. 53/80.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 101 වන ව්‍යවස්ථාව ප්‍රකාර ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම ද පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

කෙටි නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

1. මේ පනත 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් ජනාධිපතිවරයා විසින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

### ඡන්ද හිමියන්ගේ සුදුසුකම්

ලියාපදිංචි කිරීම නුසුදුසු බවට පත් කරන අවශ්‍යතා.

2. කිසියම් තැනැත්තෙක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 වන ව්‍යවස්ථාවෙහි සඳහන් නුසුදුසුකම්වලින් කිසිවකට යටත් වන්නේ නම් ඒ තැනැත්තා යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා වූ (මෙහි මින් මතු "නාම ලේඛනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් ඡන්ද හිමි නාම ලේඛනයක, යම් වර්ෂයක දී තමාගේ නම ඇතුළත් කරවා ගැනීමට හෝ තබා ගැනීමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

වයස තීරණය කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ දිනය.

3. ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා සුදුසුවීම පිණිස යම් තැනැත්තකු අවලෝස්විය සම්පූර්ණ කර සිටිය යුතු සුදුසුකම් ලැබීමේ දිනය ලෙස, යම් වර්ෂයක ජූනි මස පළමුවන දිනය. මෙසින් නියම කරනු ලැබේ.

පදිංචිය තීරණය කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ දිනය.

4. (1) යම්කිසි මැතිවරණ කොට්ඨාසයක නාම ලේඛනයෙහි යම් තැනැත්තකුගේ නම ඇතුළත් කරගනු ලැබීම හෝ තබාගැනීම සඳහා ඒ තැනැත්තා ඒ මැතිවරණ කොට්ඨාසයේ පදිංචිව සිටිය යුතු සුදුසුකම් ලැබීමේ දිනය ලෙස යම් වර්ෂයක ජූනි මස පළමුවන දිනය, මෙසින් නියම කරනු ලැබේ.

(2) යම් වර්ෂයක ජූනි මස පළමුවන දිනයේ දී යම් තැනැත්තකු යම්කිසි මැතිවරණ කොට්ඨාසයක සාමාන්‍යයෙන් පදිංචිව සිටි ලිපිනය, ඔහුගේ "සුදුසුකම් ලැබීමේ ලිපිනය" ලෙස මින් මතු සඳහන් කරනු ලැබේ.

(3) යම් වර්ෂයක ජූනි මස පළමුවන දිනයේ දී තැනැත්තකුගේ පදිංචිය පිළිබඳ යම් ප්‍රශ්නයක් තීරණය කිරීමේ දී ප්‍රස්තුත ලිපිනයෙහි ඔහුගේ සිටීම හෝ නොසිටීම මෙන් ම ඔහුගේ සිටීම හෝ නොසිටීම හා සම්බන්ධ හේතුව සහ වෙනත් අවස්ථානුගත කරුණු පිළිබඳව ද, විශේෂයෙන් ම ඔහු විසින් දරනු ලබන හෝ භාර ගන්නා ලද හෝ යම් ධුරයකින්, සේවයකින් නැතහොත් සේවා නියුක්තියකින් උද්ගතවන හෝ ඒ ධුරයට, සේවයට නැතහොත් සේවා නියුක්තියට ආනුෂංගික වන හෝ යම් කාර්යයක් ඉටුකිරීමෙහි ලා ඒ ලිපිනයෙහි ඔහුගේ නො සිටීම පිළිබඳව ද විශේෂ සැලකිල්ල දැක්විය යුතු ය.

H 039235—500 (11/2011)

ඡන්ද හිමියන් සඳහා වූ නියමිත සුදුසුකම්.

5. 6 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, අන් ලෙසකින් නුසුදුස්සකු නොවන සෑම තැනැත්තකු ම, නාම ලේඛනයක ස්වකීය නම ඇතුළත් කරවා ගැනීමට හෝ තබා ගැනීමට හෝ සුදුස්සකු විය යුතු ය.

සුදුසුකම් ලැබීමේ ලිපිනය යටතේ නාමලේඛනවල නම ඇතුළත් කිරීම හෝ තබා ගැනීම.

6. යම් වර්ෂයක දී, යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා වූ නාම ලේඛනයෙහි යම් තැනැත්තකුගේ නම ඇතුළත් කිරීම හෝ තබා ගැනීම ඔහුගේ සුදුසුකම් ලැබීමේ ලිපිනය යටතේ කළ යුතු අතර, ඒ අනුව වෙනත් යම් ලිපිනයක් යටතේ තමාගේ නම එසේ ඇතුළත් කරවා ගැනීමට හෝ තබා ගැනීමට ඒ තැනැත්තා හිමිකම් නොලැබිය යුතු ය:

එසේ වුවද ඡන්ද හිමියකු වශයෙන් ඒ තැනැත්තා ලියාපදිංචි කිරීමේ ඒ නාම ලේඛනයෙහි ඔහුගේ නම ඇතුළත් කිරීම හෝ තබා ගැනීම සම්බන්ධයෙන් මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වීම පමණක් හේතුකොටගෙන අවලංගු වෙතැයි නැතහොත් බලරහිත වෙතැයි සලකනු නොලැබිය යුතු ය; නැතහොත් එසේ අර්ථ නිරූපණය කරනු නොලැබිය යුතු ය.

එක ඡන්ද ලියාපදිංචි කිරීම සීමා කිරීම.

7. (1) නාම ලේඛන දෙකක හෝ ඊට වැඩි ගණනක තම නම ඇතුළත් කරවා ගැනීමට හෝ තබා ගැනීමට යම් තැනැත්තකු සුදුසුකම් ලැබ සිටිය හැකි වුව ද, එක් නාම ලේඛනයකට වැඩි ගණනක තම නම ඇතුළත් කරවා ගැනීමට හෝ තබා ගැනීමට ඒ තැනැත්තා හිමිකම් නොලැබිය යුතු ය.

(2) එකම නාම ලේඛනයෙහි එක් වරකට වඩා තම නාම ඇතුළත් කරවා ගැනීමට හෝ තබා ගැනීමට යම් තැනැත්තකු සුදුසුකම් ලැබ සිටිය හැකි වුව ද, එසේ තම නම ඇතුළත් කරවා ගැනීමට හෝ තබා ගැනීමට ඒ තැනැත්තා හිමිකම් නොලැබිය යුතු ය.

## II වන කොටස

### ලියාපදිංචි කිරීමේ නිලධරයෝ, ඡන්ද ප්‍රදේශ සහ ඡන්ද කොට්ඨාස

ලියාපදිංචි කිරීමේ නිලධරයන් පත් කිරීම.

8. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 97 වන ව්‍යවස්ථාව යටතේ වූ ප්‍රකාශනය ප්‍රසිද්ධ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් (මෙහි මින් මතු " කොමසාරිස්වරයා " යනුවෙන් සඳහන් කරනු ලබන) මැතිවරණ කොමසාරිස්වරයා විසින් එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා ලියාපදිංචි කිරීමේ නිලධරයකු නමින් හෝ නිල නාමයෙන් පත් කරනු ලැබිය යුතු අතර, යම් ලියාපදිංචි කිරීමේ නිලධරයකුට, ඔහුගේ කාර්ය ඉටු කිරීමෙහි ලා සහාය වීම පිණිස, එක් තැනැත්තකු හෝ තැනැත්තන් වැඩි ගණනක් නමින් හෝ නිල නාමයෙන් කලින් කල පත් කරනු ලැබිය හැකි ය. ඉහත කී පරිදි එවැනි යම් නිලධරයකුට සහාය වීම පිණිස එසේ පත් කරන ලද තැනැත්තකුට, තමා සහාය වීම පිණිස පත් කරන ලද නිලධරයාගේ සියලු බලතල තිබිය යුතු අතර, ඒ නිලධරයා විසින් ඉටු කරනු ලබන සියලු කාර්ය ද ඔහු විසින් ඉටු කරනු ලැබිය හැකි ය. තව ද පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි ලියාපදිංචි කිරීමේ නිලධරයකු සම්බන්ධයෙන් වූ යම් සඳහන් කිරීමකට සහකාර ලියාපදිංචි කිරීමේ නිලධරයකු සම්බන්ධයෙන් වූ සඳහන් කිරීමක් ද ඇතුළත් වන ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් කරන ලද පත් කිරීමක් ඕනෑම අවස්ථාවක දී ඔහු විසින් අවලංගු කරනු ලැබිය හැකි ය.

ඡන්ද ප්‍රදේශ සහ ඡන්ද කොට්ඨාස.

3. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 97 වන ව්‍යවස්ථාව යටතේ වූ ප්‍රකාශනය ප්‍රසිද්ධ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් ඉහත කී ප්‍රකාශනයෙහි සඳහන් එක් එක් මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින්, කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන යම් විධානවලට අනුකූලව,—

(අ) ඒ මැතිවරණ කොට්ඨාසය ඡන්ද ප්‍රදේශවලට බෙදා ඒ එක් එක් ඡන්ද ප්‍රදේශයට හඳුනාගැනීමේ අක්ෂරයක් හෝ අක්ෂර හෝ පවරනු ලැබිය යුතු ය;

(ආ) ඒ එක් එක් ඡන්ද ප්‍රදේශය ඡන්ද කොට්ඨාසවලට නැවත බෙදා ඒ එක් එක් ඡන්ද කොට්ඨාසයට හඳුනාගැනීමේ අංකයක් පවරනු ලැබිය යුතු ය; තව ද

(ඇ) (i) ඒ මැතිවරණ කොට්ඨාසය බෙදනු ලැබුවේ යම් ඡන්ද ප්‍රදේශවලට ද, ඒ ඡන්ද ප්‍රදේශ සහ ඒ එක් එක් ඡන්ද ප්‍රදේශයට පවරන ලද හඳුනාගැනීමේ අක්ෂරය හෝ අක්ෂර සඳහන් කරමින් ද

(ii) ඒ එක් එක් ඡන්ද ප්‍රදේශය නැවත බෙදනු ලැබුවේ යම් ඡන්ද කොට්ඨාසවලට ද ඒ ඡන්ද කොට්ඨාස සහ ඒ එක් එක් ඡන්ද කොට්ඨාසයට පවරන ලද හඳුනාගැනීමේ අංකය සඳහන් කරමින් ද

දැන්වීමක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

(2) කොමසාරිස්වරයා විසින් අන්‍යාකාරයෙන් විධාන කරන හොත් මිස ඡන්ද ප්‍රදේශයක් ඡන්ද කොට්ඨාසවලට නැවත බෙදීම, එසේ නැවත බෙදන කාලයේ දී ඒ එක් එක් ඡන්ද කොට්ඨාසයට ඡන්ද හිමියන් එක් දහස් පන්සියයකට වැඩි නොවන සංඛ්‍යාවක් ඇතුළත් වන පරිදි කළ යුතු ය.

(3) මැතිවරණ කොට්ඨාසයක් ඡන්ද ප්‍රදේශවලට බෙදීම ද, ඡන්ද ප්‍රදේශයක් ඡන්ද කොට්ඨාසවලට නැවත බෙදීම ද අවස්ථානුකූලව, අවශ්‍ය වන පරිදි ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් වෙනස් කරනු ලැබිය හැකි ය; එවැනි යම් වෙනස් කිරීමක් කරනු ලැබූ විට ඔහු විසින් ඒ මැතිවරණ කොට්ඨාසයට අදාළව (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි දැක්වෙන විස්තර සඳහන් කරමින් දැන්වීමක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය. එවැනි යම් වෙනස් කිරීමක්, ඒ මැතිවරණ කොට්ඨාසය සඳහා වූ නාම ලේඛනයේ මීළඟ සහතික කිරීමට අදාළ 20 වන වගන්තිය යටතේ වූ දැන්වීම පළ කරන ලද දිනයෙහි ක්‍රියාත්මක විය යුතු නමුත් ඒ සහතික කිරීමට පෙර ඒ නාම ලේඛනය ප්‍රතිශෝධනය කිරීම, ඒ වෙනස් කිරීම පදනම් කර ගෙන කරනු ලැබිය හැකි ය.

## III වන කොටස

### නාම ලේඛන පිළියෙළ කිරීම

නාම ලේඛනය පිළියෙළ කිරීම.

10. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 97 වන ව්‍යවස්ථාව යටතේ ප්‍රකාශනය ප්‍රසිද්ධ කරනු ලැබීමෙන් පසුව සහ 9(1) වන වගන්තියෙහි සඳහන් දැන්වීම පළ කරනු ලැබීමෙන් ඉක්බිතිව හැකිතාක් ඉක්මණින්, ඒ ප්‍රකාශනයෙහි සඳහන් එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින්, ඒ ප්‍රකාශනය ප්‍රසිද්ධ කරනු ලැබීමට පෙරාතුව ම ඒ මැතිවරණ කොට්ඨාසය සමන්විත වන ප්‍රදේශයට අදාළව වලංගුව පැවැති නාම ලේඛනයක නැතහොත් වලංගුව පැවැති නාම ලේඛනයක කොටස්වල දැක්වෙන සෑම නමක් ම, වලංගුව පැවැති නාම ලේඛනයෙහි ඒ නම එසේ දක්වා තිබුණේ යම් සුදුසුකම් ලැබීමේ ලිපිනයක් යටතේ ද ඒ ලිපිනය සමඟ, පිළියෙළ කොට සහතික කරනු ලබන නාම ලේඛනයෙහි දැක්වෙන පරිදි, ඒ මැතිවරණ කොට්ඨාසය සඳහා නාම ලේඛනයක් පිළියෙළ කොට නැතහොත් පිළියෙළ කිරීමට සලස්වා එය සහතික කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් වලංගුව පැවැති නාම ලේඛනයෙහි නැතහොත් වලංගුව පැවැති නාම ලේඛනයක කොටස්වල නම සඳහන්ව නැත ද, ඒ උපවගන්තිය යටතේ පිළියෙළ කරන ලද නාම ලේඛනයෙහි ස්වකීය නම ඇතුළත් කර ගැනීමට සුදුසුකම් ඇතැයි ලියාපදිංචි කිරීමේ නිලධරයාට පෙනී යන තැනැත්තන්ගේ නම්, 7 වන වගන්තියෙහි සඳහන් විධිවිධානවලට යටත්ව, එසේ පිළියෙළ කරන ලද නාම ලේඛනයෙහි ඇතුළත් කිරීම හෝ ඇතුළත් කිරීමට සැලැස්වීම හෝ ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් කරනු ලැබිය යුතු ය.

(3) යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා (1) වන උපවගන්තිය යටතේ පිළියෙළ කරන ලද නාම ලේඛනය සහතික කිරීමට පෙර, ඉල්ලුම්කරු සම්බන්ධයෙන් ඒ නාම ලේඛනයෙහි පවත්නා සටහනක් නිවැරදි කිරීම සඳහා ඒ මැතිවරණ කොට්ඨාසය භාර ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත ඉල්ලුම් කළ හැකි ය. එවැනි යම් ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, සුදුසු නයි ලියාපදිංචි කිරීමේ නිලධරයාට පෙනී යන යම් විභාගයකින් පසුව ඒ සටහන් ඉල්ලුම්කරුට අදාළ බවට ද එහි යම් කරුණක් සම්බන්ධයෙන් වරදක් හෝ ඌනතාවක් ඇති බවට ද ඔහු හැඟීමට පත් වුවහොත් සටහනෙහි අවශ්‍ය සංශෝධනය කිරීමට ඔහු විසින් සලස්වනු ලැබිය යුතු ය.

(4) ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් (1) වන උපවගන්තිය යටතේ පිළියෙළ කරන ලද යම් නාම ලේඛනයක් සහතික කිරීමට පෙර, එහි කර ඇතැයි ඔහුට පෙනී යන කිසියම් ලිපි දෝෂයක් ඔහු විසින් නිවැරදි කරනු ලැබීම, මේ පනතෙහි සඳහන් කිසිවකින් තහනම් කරනු ලැබේ යයි සලකනු නොලැබිය යුතු ය.

(5) මේ වගන්තියෙහි "වලංගුව පැවැති නාම ලේඛනය" යන්නෙන්, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාව ප්‍රකාර තත්කාලයෙහි වලංගුව පවත්නා, යම් ඡන්ද හිමි නාම ලේඛනයක් අදහස් වේ.

11. (1) 10 වන වගන්තිය යටතේ නාම ලේඛනයක් සහතික කරනු ලැබූ විට, ගැසට් පත්‍රයෙහි සහ එක් එක් ජාතික භාෂාවෙන් වූ යටත් පිරිසෙයින් එක් ප්‍රවෘත්ති පත්‍රයක හෝ දැන්වීමක් පළ කිරීමෙන්, ඒ නාම ලේඛනය සහතික කර ඇති බවත් ඒ නාම ලේඛනය හෝ එහි පිටපතක් ලියාපදිංචි කිරීමේ නිලධරයාගේ කාර්යාලයෙහි හෝ දැන්වීමෙහි සඳහන් කරනු ලබන ඒ කොට්ඨාසය ඇතුළත වූ වෙනත් යම් ස්ථානයක හෝ දවසේ සියලු යුක්තිසහගත වේලාවල පරීක්ෂණය සඳහා තබා ඇති බවත් ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් දැනුම් දිය යුතු ය.

නාම ලේඛනය සහතික කිරීම පිළිබඳව දැනුම් දිය යුතු බව.

(2) යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා වූ නාම ලේඛනයක් ඉහත කී දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කරන ලද දිනයෙහි සිට බලාත්මක විය යුතු අතර, සහතික කරන ලද ඊළඟ නාම ලේඛනය මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති පරිදි බලාත්මක වීමෙන්, එය නිෂ්ප්‍රභ වන තෙක් එය බලාත්මකව පැවතිය යුතු ය.

## IV වන කොටස

## නාම ලේඛන ප්‍රතිශෝධනය කිරීම

12. (1) යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා වූ නාම ලේඛනය 10 වන වගන්තිය යටතේ ප්‍රථම වරට සහතික කරනු ලැබීමෙන් පසු, එක් එක් වර්ෂයේ ජූනි මාසයේ පළමුවන දිනයෙහි හෝ එදිනට පෙර, කොමසාරිස්වරයා විසින්, ඒ නාම ලේඛනය ප්‍රතිශෝධනය කිරීම ආරම්භ කිරීමට ද ඒ නාම ලේඛනය ප්‍රතිශෝධනය කිරීම ආරම්භ කොට ඇති බව ප්‍රකාශ කරන්නා වූත් ඒ මැතිවරණ කොට්ඨාසය සඳහා ඡන්ද හිමියකුවීමට සුදුසුකම් ඇති යම් තැනැත්තකුගේ නම ඒ නාම ලේඛනයෙහි තිබේ ද යන බව ඔහු විසින් නිසැකව දැනගත හැකි අන්දම සහ නම එහි නොමැති නම් එය එහි ඇතුළත් කර ගැනීමට ඔහු ක්‍රියා කළ යුතු අන්දම ඒ හැම තැනැත්තකුට ම දැනුම් දෙන්නා වූත් නිවේදනයක් ගැසට් පත්‍රයෙහි හා එක් එක් ජාතික භාෂාවෙන් වූ යටත් පිරිසෙයින් එක් ප්‍රවෘත්ති පත්‍රයක හෝ පළ කිරීමට සහ ඒ නිවේදනය ඒ මැතිවරණ කොට්ඨාසය තුළ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රකටව පෙනෙන පරිදි ප්‍රදර්ශනය කිරීමට ද සැලැස්විය යුතු ය.

නාම ලේඛනය ප්‍රතිශෝධනය කිරීම.

(2) නාම ලේඛනය ප්‍රතිශෝධනය කිරීමේ කාර්යය සඳහා සහ ලියාපදිංචි කිරීම සඳහා යම් තැනැත්තකුගේ සුදුසුකම් පිළිබඳව සෑහීමට පත්වීමේ නැතහොත් යම් තැනැත්තකුගේ නම නාම ලේඛනයෙහි ඇතුළත් කිරීම හෝ තබා ගැනීම කළ යුතු ද යන්න නිර්ණය කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය යයි තමා සලකන අන්දමේ ගෙයින් ගෙට ගොස් කරනු ලබන හෝ අන් ආකාරයක හෝ පරීක්ෂණයක් ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් ම හෝ ඔහු විසින් පත් කරනු ලබන තැනැත්තකු මගින් හෝ කරනු ලැබිය හැකි ය. ඒ පරීක්ෂණයේ කාර්ය සඳහා, තමා මැතිවරණ කොට්ඨාසය තුළ සිටින යම් ගෘහ මූලිකයකු හෝ යම් ඉඩමක හෝ ස්ථානයක අයිතිකරුව නැතහොත් පදිංචිව සිටින යම් තැනැත්තකු නැතහොත් ඒ තැනැත්තාගේ නියෝජිතයා සතුව ඇත්තා වූ ද ලියාපදිංචි කිරීමේ නිලධරයාට අවශ්‍ය වන්නා වූ ද යම් තොරතුරක්, කොමසාරිස්වරයා විසින් කලින් කල නියම කරනු ලබන යම් ආකෘතියක සපයන ලෙස ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් ඔහුට නියම කරනු ලැබිය හැකි ය. මේ උපවගන්තිය යටතේ

තොරතුරු සපයන ලෙස නියම කෙරෙන යම් දැන්වීමක්, තොරතුරු අවශ්‍ය වන්නේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා වෙත සාමාන්‍ය තැපැලෙන් යවනු ලැබිය හැකි ය; එසේ නැතහොත් ඔහුට හෝ ඔහුගේ නිවසේ වැඩි ගිටි සාමාජිකයකු වෙත හෝ බාර දෙනු ලැබිය හැකි ය.

(3) ලියාපදිංචි කිරීමේ නිලධරයාට නාම ලේඛනය ප්‍රතිශෝධනය කිරීම කළ හැකිවනු පිණිස, ඔහුට අවශ්‍ය වන සියලු තොරතුරු ඔහු වෙත සැපයීමට (යම් ලිඛිත නීතියක් යටතේ රහස්‍යතා දිවුරුමකින් බැඳී සිටින යම් සේවාවක නිලධරයන් නොවන) ශ්‍රී ලංකා ආණ්ඩුවේ හෝ යම් රාජ්‍ය සංස්ථාවක හෝ යම් පළාත් පාලන ආයතනයක සේවයෙහි නියුක්ත සියලු ම නිලධරයන්ට මෙයින් බලය දෙනු ලබන අතර, ඒ තොරතුරු සපයන ලෙස ඒ නිලධරයන්ට මෙයින් නියම කරනු ලැබේ.

(4) (2) වන උපවගන්තිය යටතේ අවශ්‍ය තොරතුරු කිසිවක් තමා සතුව තිබිය දී, ඒ තොරතුරු ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත හෝ තත් කාර්යය සඳහා ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් පත් කරන ලද යම් තැනැත්තකු වෙත හෝ සැපයීම පැහැර හරින නැත හොත් ඕනෑකමින් ම යම් අසත්‍ය තොරතුරක් සපයන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන් සියයක් නො ඉක්මවන දඩයකට හෝ එක් මාසයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(5) ලියාපදිංචි කිරීමේ නිලධරයකු විසින් පත් කරනු ලැබ සිටින්නා වූ ද—

(අ) ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි කිරීම සඳහා යම් තැනැත්තකුගේ සුදුසුකම්වලට අදාළ වූ හෝ යම් තැනැත්තකුගේ නම නාමලේඛනයෙහි ඇතුළත් කරනු ලැබිය යුතු ද නොයුතු ද නැතහොත් තබා ගත යුතු ද නොයුතු ද යන බව නිරණය කිරීම පිණිස අදාළ වූ තොරතුරු කිසිවක් තමන් වෙත සපයනු ලැබීමෙන් නැතහොත් තමා විසින් ම සොයා ගනු ලැබීමෙන් පසු ඒ තොරතුර ඕනෑකමින් ම යටපත් කරන්නා වූ ද එසේ නැතහොත් පෙර කී කාර්යය සඳහා අදාළ වන තොරතුරු කිසිවක් අසත්‍ය බව දැන දැන ම ඒ තොරතුර දෙන්නා වූ ද; නැතහොත්

(ආ) ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි කරනු ලැබීම හෝ තබා ගැනීම සඳහා හිමිකම් ඇති යම් තැනැත්තකුගේ නම, ඕනෑකමින් ම සහ යුක්ති සහගත හේතුවක් නොමැතිව නාම ලේඛනයෙන් ඉවත් කරන්නා වූ නැතහොත් ඉවත් කිරීමට සලස්වන්නා වූ සහ නාම ලේඛනයෙහි ඇතුළත් කිරීම ඕනෑකමින් ම සහ යුක්ති සහගත හේතුවක් නොමැතිව පැහැර හරින්නා වූ ද

සෑම නිලධරයකු ම, වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන් සියයක් නොඉක්මවන දඩයකට හෝ එක් මාසයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(6) යම් වර්ෂයක දී යම් නාම ලේඛනයක් ප්‍රතිශෝධනය කිරීමක දී තමාගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ නම ඒ නාම ලේඛනයෙහි ඇතුළත් කරවා ගැනීමට හෝ තබා ගැනීමට තමා හෝ ඒ වෙනත් තැනැත්තා සුදුසුකම් ලබා නොමැති බව දැන දැනම, අවස්ථෝචිත පරිදි තමාගේ ම හෝ ඒ වෙනත් තැනැත්තාගේ නම ඒ නාම ලේඛනයෙහි ඇතුළත් කරවා ගැනීම හෝ තබා ගැනීම සඳහා හිමිකම් පෑමක් ඉදිරිපත් කරන හෝ ඉල්ලුම් කරන නැතහොත් හිමිකම් පෑමක් ඉදිරිපත් කරන ලෙස හෝ ඉල්ලීමක් කරන ලෙස ඒ වෙනත් තැනැත්තා පොළඹවන හෝ ඔහුට ආධාර කරන හෝ අනුබල දෙන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර මහෙස්ත්‍රාත් වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ එක් මාසයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(7) (අ) යම් තැනැත්තකු ඔහුගේ නම—

(i) නාම ලේඛන එකකට වැඩි ගණනක; හෝ

(ii) සුදුසුකම් ලැබීමේ විවිධ ලිපින යටතේ එකම නාම ලේඛනයෙහි එක් වරකට වැඩියෙන්; හෝ

ඇතුළත් කරවා ගැනීමට හෝ තබා ගනු ලැබීමට සුදුසුකම් ලැබ ඇතැයි පෙනී යන අවස්ථාවක, අවස්ථෝචිත පරිදි, ඔහුගේ නම ඇතුළත් කරවා ගැනීමට හෝ තබා ගනු ලැබීමට ඔහු කැමති නාම ලේඛනය හෝ, ඔහුගේ නම, ඉහත කී නාම ලේඛනයෙහි ම ඇතුළත් කරවා ගැනීමට හෝ තබා ගනු ලැබීමට ඔහු කැමති වන්නේ සුදුසුකම් ලැබීමේ යම් ලිපිනයක් යටතේ ද ඒ ලිපිනය හෝ දැන්වීම භාර දීමෙන් පසු දින හතක් ඇතුළත සඳහන් කරන ලෙස නියම කරමින් ඒ තැනැත්තා වෙත දැන්වීමක් භාර දෙනු ලැබීමට ලියාපදිංචි කිරීමේ නිලධරයකු විසින් සැලැස්විය යුතු ය.

(ආ) (අ) ඡේදයෙහි සඳහන් යම් දැන්වීමක් (2) වන උප වගන්තියෙහි ඒ සඳහා විධිවිධාන සලස්වා ඇති ආකාරයට භාර දෙනු ලැබිය හැකි ය.

(ඇ) (අ) ඡේදය යටතේ වූ දැන්වීමක් අනුව ක්‍රියා කරමින් යම් තැනැත්තකු—

(i) තමාගේ නම ඇතුළත් කරවා ගැනීමට හෝ තබා ගනු ලැබීමට තමා කැමති නාම ලේඛනය සඳහන් කරන සහ ඔහුගේ නම ඒ නාම ලේඛනයෙහි ඇතුළත් කරවා ගැනීමට හෝ තබා ගනු ලැබීමට ඒ තැනැත්තාට සුදුසුකම් ඇතැයි අදාළ මැතිවරණ කොට්ඨාසය සඳහා වූ ලියාපදිංචි කිරීමේ නිලධරයා සෑහීමට පත් වන අවස්ථාවක, ඔහුගේ නම අන් කිසි නාම

ලේඛනයක නොව ඒ නාම ලේඛනයෙහි ම ඇතුළත් කළ යුතු ය; එසේ නැතහොත් තබා ගනු ලැබිය යුතු ය; නැතහොත්

(ii) තමාගේ නම ඒ නාම ලේඛනයෙහි ම ඇතුළත් කරවා ගැනීමට හෝ තබා ගනු ලැබීමට තමා කැමති වන්නේ සුදුසුකම් ලැබීමේ යම් ලිපිනයක් යටතේ ද ඒ ලිපිනය සඳහන් කරන සහ ඔහුගේ නම ඒ ලිපිනය යටතේ ඒ නාමලේඛනයෙහි ඇතුළත් කරවා ගැනීමට හෝ තබා ගනු ලැබීමට ඒ තැනැත්තාට සුදුසුකම් ඇතැයි ලියාපදිංචි කිරීමේ නිලධරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඔහුගේ නම ඒ නාම ලේඛනයෙහි අන් කිසි ලිපිනයක් යටතේ නොව ඒ නාම ලේඛනයෙහි ඒ ලිපිනය යටතේ ම ඇතුළත් කළ යුතු ය; නැතහොත් තබා ගනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ වූ දැන්වීමක් අනුව ක්‍රියා කිරීම යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක—

(i) තමාගේ නම ඇතුළත් කරවා ගැනීමට හෝ තබා ගනු ලැබීමට ඒ තැනැත්තා කැමති නාම ලේඛනය සඳහන් කරන ලෙස ඒ තැනැත්තාට ඒ දැන්වීමෙන් නියම කරන ලද්දේ නම් ඔහුගේ නම ඇතුළත් කරවා ගැනීමට හෝ තබා ගනු ලැබීමට ඒ තැනැත්තා සුදුසුකම් ලබා ඇති නාම ලේඛන අතුරින් ඒ නම ඇතුළත් කළ යුතු හෝ තබා ගනු ලැබිය යුතු නාම ලේඛනය කුමක් දැයි කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර, අන් කිසි නාම ලේඛනයක නොව කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලැබූ නාම ලේඛනයෙහි ම, ඒ නාම ඇතුළත් කළ යුතු ය; නැතහොත් තබා ගනු ලැබිය යුතු ය; නැතහොත්

ii) තමාගේ නම ඒ නාම ලේඛනයෙහි ම ඇතුළත් කරවා ගැනීමට හෝ තබා ගනු ලැබීමට ඒ තැනැත්තා කැමති වන්නේ සුදුසුකම් ලැබීමේ යම් ලිපිනයක් යටතේ ද ඒ ලිපිනය සඳහන් කරන ලෙස, ඒ තැනැත්තාට ඒ දැන්වීමෙන් නියම කරන ලද්දේ නම්, ඔහුගේ නම ඇතුළත් කරවා ගැනීමට හෝ තබා ගනු ලැබීමට ඒ තැනැත්තාට සුදුසුකම් ඇති ඒ නාම ලේඛනයෙහි ම වූ සුදුසුකම් ලැබීමේ ලිපින අතුරින් කවර ලිපිනයක් යටතේ ඒ නම, ඒ නාම ලේඛනයෙහි ඇතුළත් කළ යුතු දැයි හෝ තබා ගනු ලැබිය යුතු දැයි ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් නිශ්චය කරන ලැබිය යුතු අතර. ඒ නාම ලේඛනයෙහි වූ සුදුසුකම් ලැබීමේ අන් කිසි ලිපිනයක් යටතේ නොව ලියාපදිංචි

කිරීමේ නිලධරයා විසින් නිශ්චය කරනු ලැබූ සුදුසුකම් ලැබීමේ ලිපිනය යටතේ ම, ඒ නාම ඇතුළත කළ යුතු ය; නැතහොත් තබා ගනු ලැබිය යුතු ය.

(ඉ) (අ) ඡේදය යටතේ බාර දෙන ලද යම් දැන්වීමක් අනුව ක්‍රියා කිරීම යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලැබීම හේතුකොටගෙන හෝ ඒ තැනැත්තා සම්බන්ධයෙන් (ආ) ඡේදයෙහි විධිවිධාන අනුව ක්‍රියා කිරීම කොමසාරිස්වරයා විසින් නැතහොත් ලියාපදිංචි කිරීමේ නිලධරයකු විසින් පැහැර හරිනු ලැබීම හේතුකොට ගෙන හෝ එසේ ඒ අනුව ක්‍රියා කළ විට ඒ තැනැත්තා විසින් සඳහන් කරන ලද යම් නාම ලේඛනයක නැතහොත් ඒ නාම ලේඛනයෙහි ම වූ සුදුසුකම් ලැබීමේ යම් ලිපිනයක් යටතේ ඔහුගේ නම ඇතුළත් කර නොමැති වීම හෝ තබා ගෙන නොමැතිවීම හෝ හේතුකොටගෙන අවස්ථෝචිත පරිදි, ඔහුගේ නම ඇතුළත් කරවා ගැනීමට හෝ තබා ගනු ලැබීමට ඔහුට සුදුසුකම් ඇති යම් නාම ලේඛනයක හෝ ඒ නාම ලේඛනයෙහි ම වූ සුදුසුකම් ලැබීමේ යම් ලිපිනයක් යටතේ හෝ 7 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව ඔහුගේ නම ඇතුළත් කරවා ගැනීමට හෝ තබා ගනු ලැබීමට හෝ ඔහුට ඇති අයිතිවාසිකම් කෙරෙහි බලපෑමක් හෝ හානියක් නොවිය යුතු ය.

නාම ලේඛනය ප්‍රතිශෝධනය කිරීමේ ක්‍රමය.

13. (1) එක් එක් වර්ෂයේ දී නාමලේඛනය ප්‍රතිශෝධනය කිරීමේ කාර්යය සඳහා ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් නාමලේඛනයෙහි ඇතුළත්ව සිට මිය ගොස් ඇත්තා වූ නැතහොත් ඒ නාම ලේඛනයෙහි දක්වා ඇති සුදුසුකම් ලැබීමේ ලිපිනය යටතේ ලියාපදිංචිය සඳහා නුසුදුසු බවට පත්ව සිටින්නා වූ නැතහොත් වෙනත් යම් හේතුවක් නිසා නුසුදුසුව සිටින්නා වූ, තැනැත්තන්ගේ නම් ඇතුළත් මෙහි මින් මතු "'අ' ලැයිස්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන එක් ලැයිස්තුවක් ද සුදුසුකම් ලැබීමේ ලිපිනය යටතේ නාම ලේඛනයෙහි දැනට ඇතුළත්ව හෝ අන්‍යාකාරයකින් නුසුදුසුසන්ව හෝ නොමැත්තා වූ ද සුදුසුකම් ලැබීමේ ලිපිනයක් යටතේ තම නම් නාම ලේඛනයෙහි ඇතුළත් කරවා ගැනීමට සුදුසුකම් ඇතැයි ලියාපදිංචි කිරීමේ නිලධරයාට පෙනී යන්නා වූ ද, තැනැත්තන්ගේ නම් ඇතුළත් මෙහි මින් මතු "'ආ' ලැයිස්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන වෙනත් ලැයිස්තුවක් ද වශයෙන් වෙන වෙනම ලැයිස්තු දෙකක් පිළියෙල කරනු ලැබිය යුතු ය.

ඒ ලැයිස්තු පිළියෙල කිරීම, ඊළඟට එළඹෙන වර්ෂයේ ජනවාරි මස තිස් එක් වන දින හෝ එදිනට පෙර ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් සම්පූර්ණ කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් ලැයිස්තු දෙක අවසන් කරනු ලැබූ විට, ගැසට් පත්‍රයෙහි සහ එක් එක් ජාතික භාෂාවෙන් වූ යටත් පිරිසෙයින් එක් ප්‍රවෘත්ති පත්‍රයක හෝ දැන්වීමක් පළ කිරීමෙන්, ඒ ලැයිස්තු අවසන් කර ඇති බවත් නාමලේඛනය සහ ඒ ලැයිස්තු හෝ ඒවායේ පිටපත් නැතහොත් උද්ධෘත හෝ

ලියාපදිංචි කිරීමේ නිලධරයාගේ කාර්යාලයෙහි සහ දැන්වීමෙහි සඳහන් කරනු ලබන ඒ මැතිවරණ කොට්ඨාසය ඇතුළත වූ වෙනත් යම් ස්ථානවල හෝ දවසේ සියලු යුක්තිසහගත වේලාවල පරීක්ෂණය සඳහා තබා ඇති බවත් ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් දැනුම් දිය යුතු ය.

නාම ලේඛන ප්‍රතිශෝධනය කිරීමේ දී හිමිකම් පෑම් සහ විරෝධතා පෑම්.

14. (1) යම් නාම ලේඛනයක් ප්‍රතිශෝධනය කිරීමේ දී, යම් පාර්ශ්ව අනුව ඒ නාම ලේඛනයෙහි තමාගේ නම ඇතුළත් කරවා ගැනීමට නැතහොත් තබා ගනු ලැබීමට සුදුසුකම් ඇත්තා වූ ද තමාගේ නාම ඒ නාම ලේඛනයෙන් සහ "'ආ' ලැයිස්තුවෙන්" අත් හරිනු ලැබ ඇත්තාවූ නැතහොත් තමාගේ නම "'අ' ලැයිස්තුවෙහි" ඇතුළත් කරනු ලැබ ඇත්තා වූ ද, අවස්ථාවෝචිත පරිදි, තමාගේ නම ඒ නාම ලේඛනයෙහි ඇතුළත් කරවා ගැනීමට නැතහොත් තබා ගනු ලැබීමට හිමිකම් පාන්නා වූ ද (මේ වගන්තියෙහි සහ 15 වන වගන්තියෙහි "හිමිකම් පාන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) සෑම තැනැත්තකු විසින්, තමාගේ නම සුදුසුකම් ලැබීමේ ලිපිනයක් යටතේ ඒ නාම ලේඛනයෙහි ඇතුළත් කරවා ගැනීම හෝ තබා ගනු ලැබීම පිණිස ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත ඉල්ලුම් කරනු ලැබිය හැකි ය. මේ උපවගන්තිය යටතේ වූ සෑම හිමිකම් පෑමක් ම ලියවිල්ලකින් විය යුතු අතර, එය මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති "අ" ආකෘතියට සාරානුකූල විය යුතු ය.

(2) යම් නාම ලේඛනයක තමාගේ නම ඇතුළත් කරවා ගැනීමට හෝ තබා ගනු ලැබීමට යම් තැනැත්තකු (1) වන උපවගන්තිය යටතේ හිමිකම් ලබා ඇති අවස්ථාවක, ඒ තැනැත්තාගේ නම සුදුසුකම් ලැබීමේ ලිපිනයක් යටතේ ඒ නාම ලේඛනයෙහි ඇතුළත් කරවා ගැනීම හෝ තබා ගනු ලැබීම පිණිස (මේ වගන්තියෙහි සහ 15 වන වගන්තියෙහි "ඉල්ලුම්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් යම් තැනැත්තකු විසින් ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත ඉල්ලුම් කරනු ලැබිය හැකි ය. මේ උපවගන්තිය යටතේ වූ සෑම හිමිකම් පෑමක් ම ලියවිල්ලකින් විය යුතු අතර, එය මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති "ආ" ආකෘතියට සාරානුකූල විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය හෝ යටතේ වූ සෑම හිමිකම් පෑමක් ම ලියවිල්ලකින් විය යුතු අතර, එය ලැයිස්තුව අවසන් කිරීම පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයෙහි සිට සති හතරක් ඇතුළත ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත ලැබෙන පරිදි කරනු ලැබිය යුතු ය. එක් එක් හිමිකම් පාන්නාගේ නම සහ ලිපිනය ඇතුළත් දැන්වීමක් ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින්, ස්වකීය කාර්යාලයෙහි ප්‍රකටව පෙනෙන ස්ථානයක කලින් කල ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(4) යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා වූ නාම ලේඛනයෙහි නැතහොත් "ආ" ලැයිස්තුවෙහි නම ඇතුළත්ව තිබෙන්නේ යම් තැනැත්තකුගේ ද, ඒ තැනැත්තා විසින්—

(අ) තමාගේ ම නම; හෝ

(ආ) ඒ නාම ලේඛනයෙහි නැතහොත් 'ආ' ලැයිස්තුවෙහි දැක්වෙන වෙනත් යම් තැනැත්තකුගේ නම; හෝ

(ඈ) යම් හිමිකම් පාන්නකුගේ නම
ඒ නාම ලේඛනයෙහි ඇතුළත් කිරීම හෝ තබා ගැනීම සම්බන්ධයෙන් විරෝධය පෑම කළ හැකි ය.

(5) නාම ලේඛනයෙහි යම් නමක් ඇතුළත් කිරීම නැතහොත් තබා ගැනීම සම්බන්ධයෙන් විරෝධය පාන සෑම තැනැත්තකු ම, මේ වගන්තියෙහි සහ 15 වන වගන්තියෙහි "විරෝධය පාන්නා" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(6) නාම ලේඛනයෙහි යම් නමක් ඇතුළත් කිරීම හෝ තබා ගැනීම සම්බන්ධයෙන් (4) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ වූ සෑම විරෝධය පෑමක් ම, පිටපත් දෙකකින් යුක්තව ලියවිල්ලකින් විය යුතු අතර, එය මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති "ඇ" ආකෘතියට සාරානුකූල විය යුතු ය. තවද එය, "අ" ලැයිස්තුව සහ "ආ" ලැයිස්තුව අවසන් කිරීම පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයෙහි සිට සති හතරක් ඇතුළත ලියාපදිංචි කිරීමේ නිලධාරියා වෙත ලැබෙන පරිදි ඉදිරිපත් කළ යුතු ය. එක් එක් විරෝධය පාන්නාගේ සහ ඒ විරෝධය පෑම කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ එක් එක් තැනැත්තාගේ නම සහ ලිපිනය ඇතුළත් දැන්වීමක් ලියාපදිංචි කිරීමේ නිලධාරියා විසින් ස්වකීය කාර්යාලයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක කලින් කල ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(7) යම් හිමිකම් පාන්නකුගේ නම, නාම ලේඛනයෙහි ඇතුළත් කිරීම සම්බන්ධයෙන් (4) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ වූ සෑම විරෝධය පෑමක් ම, පිටපත් දෙකකින් යුක්තව ලියවිල්ලකින් විය යුතු අතර, එය මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති 'ඇ' ආකෘතියට සාරානුකූල විය යුතු ය. තවද, එය, ඒ හිමිකම් පාන්නාගේ නාම ඇතුළත් දැන්වීම, (3) වන උපවගන්තිය යටතේ ප්‍රදර්ශනය කරන ලද දිනයෙහි සිට දින දහ හතරක් ඇතුළත ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත ලැබෙන පරිදි ඉදිරිපත් කළ යුතු ය. එක් එක් විරෝධය පාන්නාගේ සහ ඒ විරෝධය පෑම කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ එක් එක් තැනැත්තාගේ නම සහ ලිපිනය ඇතුළත් දැන්වීමක් ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින්, ස්වකීය කාර්යාලයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක කලින් කල ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(8) මේ වගන්තිය යටතේ වූ විරෝධය පෑමක් ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින්, ඒ විරෝධය පෑමෙහි එක් පිටපතක්, ඒ විරෝධය පෑම කරනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා වෙත යවනු ලැබිය යුතු ය.

(9) විධිමත් පරිදි කරනු ලැබ ඇති සියලු හිමිකම් පෑම් සහ විරෝධය පෑම් සම්බන්ධයෙන් ප්‍රසිද්ධ විභාගයක්, ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින්, ඒ විභාගය ආරම්භ වන දිනය, වේලාව සහ ස්ථානය පිළිබඳව සම්පූර්ණ දින හතකට නොඅඩු කාලයකට පෙර ලිඛිත දැන්වීමක් එක් එක් හිමිකම් පාන්නා, ඉල්ලුම්කරු, විරෝධය පාන්නා සහ විරෝධය පෑම කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා වෙත යවා, හැකිතාක් ඉක්මණින්

පවත්වනු ලැබිය යුතු ය. එවැනි යම් ප්‍රසිද්ධ විභාගයක දී, විභාගයේ විෂයගත කරුණු පිළිබඳව උනන්දුවක් දක්වන නැතහොත් ඉන් ආවේදිත තැනැත්තකු ලෙස ලියාපදිංචි කිරීමේ නිලධරයාට පෙනී යන යම් තැනැත්තකුට තමා විසින් ම, හෝ ඒ සඳහා ඔහු විසින් යථා පරිදි ලියවිල්ලකින් බලය දෙන ලද වෙනත් යම් තැනැත්තකු මගින් හෝ පෙනී සිටීම සහ කරුණු කියා සිටීම කරනු ලැබිය හැකිය :

එසේ වුවද කිසිම විරෝධය පෑමක් කර නොමැත්තේ යම් හිමිකම් පෑමක් සම්බන්ධයෙන් ද ඒ හිමිකම් පෑමට ඉඩ දිය යුතු බවට ලියාපදිංචි කිරීමේ නිලධරයා අනායාසාකාරයකින් හැඟීමට පත්වන්නේ නම්, ඔහු විසින් පෙර කී පරිදි වූ කිසිදු ප්‍රසිද්ධ විභාගයක් නොකොට එවැනි හිමිකම් පෑමකට ඉඩ දෙනු ලැබිය හැකි අතර, හිමිකම් පාන්නාගේ නම නාම ලේඛනයෙහි ඇතුළත් කරනු ලැබිය යුතු ය:

එසේම තවදුරටත්, එසේ කිරීම අවශ්‍ය යයි ලියාපදිංචි කිරීමේ නිලධරයා සලකන්නේ නම්, ඔහු විසින්, යම් හිමිකම් පාන්නකුට, ඉල්ලුම්කරුවකුට, විරෝධය පාන්නකුට නැතහොත් විරෝධය පෑම කරන ලද්දේ යම් තැනැත්තකුට විරුද්ධව ද ඒ තැනැත්තාට ලියවිල්ලකින් වූ විධානයක් කිරීමෙන් ඒ හිමිකම් පාන්නා, ඉල්ලුම්කරු, විරෝධය පාන්නා නැතහොත් ඒ තැනැත්තා විසින් ඒ සඳහා යථා පරිදි බලය දෙන ලද වෙනත් යම් තැනැත්තකු මගින් හෝ පෙර කී පරිදි වූ යම් ප්‍රසිද්ධ විභාගයකින් පෙනී සිටින ලෙස විධාන කරනු ලැබිය හැකි ය. තවද එවැනි විධානයක් අනුව ක්‍රියා කිරීම ඒ තැනැත්තා විසින් පැහැර හරිනු ලැබුවහොත් ඒ තැනැත්තා වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබූ විට රුපියල් පන් සියයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

(10) මේ වගන්තිය යටතේ විරෝධය පෑමක් කරනු ලැබූ අවස්ථාවක, විරෝධය පෑමට හේතුව පිළිබඳව තමා හැඟීමට පත් වන පරිදි සාක්ෂි ඉදිරිපත් කරන ලෙස ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් විරෝධය පාන්නාට හෝ විරෝධය පාන්නා විසින් ඒ සඳහා ලියවිල්ලකින් බලය දෙන ලද යම් තැනැත්තකුට හෝ නියම කරනු ලැබිය යුතු ය.

(11) මේ වගන්තිය යටතේ විරෝධය පෑමක් පිළිබඳව ලියාපදිංචි කිරීමේ නිලධරයා හැඟීමට පත් වන පරිදි සාක්ෂි ඉදිරිපත් කරනු ලැබුවේ නම්, විරෝධය පෑම කරනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාගේ සුදුසුකම පිළිබඳව සාක්ෂි ඉදිරිපත් කරන ලෙස ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් නියම කරනු ලැබිය යුතු ය; තව ද—

(අ) ලියාපදිංචි කිරීමේ නිලධරයා හැඟීමට පත්වන පරිදි ඒ තැනැත්තාගේ සුදුසුකම් ඔප්පු කරනු නොලැබුවහොත්, අවස්ථෝචිත පරිදි ඒ තැනැත්තාගේ නම නාම ලේඛනයෙන් ඉවත් කිරීම හෝ නාම ලේඛනයෙහි ඇතුළත් කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඒ නිලධරයා විසින් කරනු ලැබිය යුතු ය;

(ආ) ඒ තැනැත්තාගේ සුදුසුකම ඔප්පු කරනු ලැබුවහොත්, ඒ තැනැත්තාගේ නම නාම ලේඛනයෙහි ඇතුළත් කිරීම හෝ තබා ගැනීම හෝ ඒ නිලධරයා විසින් කරනු ලැබිය යුතු ය.

(12) යම් විරෝධය පෑමක් විභාග කිරීම නියම කරන ලද දිනයේ දී විරෝධය පාන්නා හෝ විරෝධය පාන්නා විසින් ඒ සඳහා ලිය විල්ලකින් බලය දෙන ලද තැනැත්තා හෝ පෙනී සිටීම පැහැර හැරියහොත් හෝ පෙනී සිටින නමුත් ලියාපදිංචි කිරීමේ නිලධරයා සෑහීමට පත්වන පරිදි සාක්ෂි ඉදිරිපත් කිරීම පැහැර හැරියහොත්, එවිට—

(අ) විරෝධය පෑම, නාම ලේඛනයෙහි නම දක්වෙන තැනැත්තකුගේ නම එහි තබා ගැනීම හෝ "ආ" ලැයිස්තුවෙහි නම දක්වෙන තැනැත්තකුගේ නම එහි ඇතුළත් කිරීම හෝ සම්බන්ධයෙන් නම්, ස්වකීය සුදුසුකම් ඔප්පු කරන ලෙස ඒ තැනැත්තාට නියම නොකොට ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් ඒ තැනැත්තාගේ නම අවස්ථෝචිත පරිදි ඒ නාම ලේඛනයෙහි තබා ගැනීම හෝ ඇතුළත් කිරීම හෝ කරනු ලැබිය යුතු ය;

(ආ) විරෝධය පෑම, යම් හිමිකම් පාන්නකුගේ නම නාම ලේඛනයෙහි ඇතුළත් කිරීම සම්බන්ධයෙන් නම්, හිමිකම් පාන්නාගේ සුදුසුකම පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කරන ලෙස ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් නියම කරනු ලැබිය යුතු අතර,—

(i) ලියාපදිංචි කිරීමේ නිලධරයා සෑහීමට පත්වන පරිදි හිමිකම් පාන්නාගේ සුදුසුකම් ඔප්පු කරනු නොලැබුවහොත්, හිමිකම් පාන්නාගේ නම ඒ නාම ලේඛනයෙහි ඇතුළත් කිරීම ඔහු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය:

(ii) හිමිකම් පාන්නාගේ සුදුසුකම් එසේ ඔප්පු කරනු ලැබුවහොත්, ඔහු විසින් හිමිකම් පාන්නාගේ නම ඒ නාම ලේඛනයෙහි ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(13) යම් විරෝධය පෑමක් කරනු ලැබ, එය ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් උත්සාරණය කරනු ලැබුවහොත්, සහ ඒ විරෝධය පෑම යුක්තිසහගත හේතුවක් නොමැතිව කරන ලද බව ඔහුගේ මතය වන්නේ නම්, විරෝධය පෑම කරනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාට විරෝධය පෑමේ ප්‍රතිඵලයක් වශයෙන් දරන්නට සිදුවුන යම් කාලය අපතේ යාමක් සඳහා යුක්ති සහගත වන්දියක් යයි ලියාපදිංචි කිරීමේ නිලධරයා සලකන, රුපියල් පණහක් නොඉක්මවන යම් මුදලක් ඒ තැනැත්තාට ගෙවන ලෙස විරෝධය පාන්නාට නියම කිරීම සුදුසු යයි ලියාපදිංචි කිරීමේ නිලධරයා කල්පනා කරන්නේ නම් ඔහු විසින් එසේ නියම කරනු ලැබිය හැකි ය.

(14) විරෝධය පෑමක් උත්සාරණය කරනු ලැබූ කල්හි, විරෝධය පාන්නා විසින් 15 වන වගන්තිය යටතේ ප්‍රතිශෝධනය කිරීමේ නිලධරයා වෙත අභියාචනයක් කරනු ලැබුවහොත් සහ ඒ අභියාචනය නිෂ්ප්‍රභ කරනු ලැබුවහොත් ද, ඒ අභියාචනය යුක්ති සහගත හේතුවක් නොමැතිව කරන ලද බව ඔහුගේ මතය වෙයි නම් ද, විරෝධය පෑම කරනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාට, අභියාචනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් දරන්

නට සිදු වුනු යම් කාලය අපතේ යාමක් සඳහා යුක්ති සහගත වන්දියක් යයි ප්‍රතිශෝධනය කිරීමේ නිලධරයා සලකන, රුපියල් පණහක් නොඉක්මවන යම් මුදලක් ඒ තැනැත්තාට ගෙවන ලෙස, විරෝධය පාන්නාට නියම කිරීම සුදුසු යයි ප්‍රතිශෝධනය කිරීමේ නිලධරයා කල්පනා කරන්නේ නම් ඔහු විසින් එසේ නියම කරනු ලැබිය හැකි ය. පෙර කී පරිදි වූ යම් අභියාචනයකට ප්‍රතිශෝධනය කිරීමේ නිලධරයා විසින් ඉඩ දෙනු ලැබුවහොත් විරෝධය පාන්නා විසින් වන්දි ගෙවනු ලැබිය යුතු බවට ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් කරන ලද යම් නියමයක්, ප්‍රතිශෝධනය කිරීමේ හෝ අවලංගු කිරීමේ බලය ඒ ප්‍රතිශෝධනය කිරීමේ නිලධරයාට තිබිය යුතු ය.

(15) ලියාපදිංචි කිරීමේ නිලධරයකු විසින් හෝ ප්‍රතිශෝධනය කිරීමේ නිලධරයකු විසින් නියමයක් මගින් මේ වගන්තිය යටතේ වන්දියක් ලෙස ප්‍රදානය කරන ලද්දේ යම් මුදලක් ද ඒ මුදල, ඒ නියමය, අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් වූවාක් මෙන් සලකා, අය කරගනු ලැබිය යුතු ය.

(16) යම් හිමිකම් පෑමක් හෝ විරෝධය පෑමක් සම්බන්ධයෙන්, ලියාපදිංචි කිරීමේ නිලධරයකු විසින් මේ වගන්තිය යටතේ කරනු ලබන යම් තීරණයක්, එක් එක් හිමිකම් පාන්නා, ඉල්ලුම්කරු, විරෝධය පාන්නා නැතහොත් විරෝධය පෑම කරනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබිය යුතු ය. ඒ දැන්වීම සාමාන්‍ය තැපැලෙන් යවනු ලැබිය යුතු ය.

ප්‍රතිශෝධනය කිරීමේ නිලධරයා වෙත අභියාචනා කිරීම

15. (1) යම් හිමිකම් පාන්නකු, ඉල්ලුම්කරුවකු, විරෝධය පාන්නකු නැතහොත් විරෝධය පෑම කරනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා හෝ ලියාපදිංචි කිරීමේ නිලධරයාගේ තීරණය කෙරෙහි සෑහීමට පත් නොවන්නේ නම්, ඔහු විසින්, ඒ තීරණය පිළිබඳ දැනුම් දීම ලැබී දින දහයක් ඇතුළත ඒ සම්බන්ධයෙන් ප්‍රතිශෝධනය කිරීමේ නිලධරයා වෙත අභියාචනය කළ හැකි ය.

(2) මේ වගන්තිය යටතේ වූ සෑම අභියාචනයක් ම, ලියවිල්ලකින් විය යුතු ය. තව ද අභියාචනය කිරීමට හේතුව එහි පුහුණින් සඳහන් විය යුතු අතර, රුපියල් පහක මුද්දරයක් එහි අලවා තිබිය යුතු ය.

(3) අභියාචනය විභාග කිරීමේ දිනය පිළිබඳව අදාළ පාර්ශ්වකරුවනට දැන්වීමක් කර, ප්‍රතිශෝධනය කිරීමේ නිලධරයා විසින්, විවෘත අධිකරණයේ දී හෝ කාර්යාලයේ දී ඒ අභියාචනය විභාග කරනු ලැබිය යුතු ය. යම් සාක්ෂි විභාගයක් කළ යුතු ද නැද්ද යන්න, ඔහුගේ අභිමතය පරිදි විය යුතු ය. අභියාචනය සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසානාත්මක විය යුතු ය.

(4) යම් නාම ලේඛනයක් සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලැබ ඇති අභියාචන ප්‍රතිශෝධනය කිරීමේ නිලධරයා විසින් තීරණය කරනු ලැබූ විට, නාම ලේඛනයෙහි ඇතුළත් කළ යුතු නැතහොත් තබා ගත යුතු ලෙස ඔහු විසින් තීරණය කරන ලද නම් සහ නාම ලේඛනයෙන් ඉවත් කළ යුතු ලෙස ඔහු විසින් තීරණය කරන ලද නම් ඇතුළත් ඔහුගේ අත්සන යටතේ වූ ප්‍රකාශයක්, ලියාපදිංචි

කිරීමේ නිලධරයා හෝ ඔහු විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් නාම ලේඛනය ඒ අනුව සංශෝධනය කරනු ලැබිය යුතු ය.

(5) අභියාචනයකට ඉඩ දෙනු ලැබුවහොත් (2) වන උපවගන්තිය යටතේ ගෙවන ලද රුපියල් පහක මුදල, අභියාචකට වෙත ආපසු ගෙවනු ලැබිය යුතු ය.

අසත්‍ය ප්‍රකාශ යනාදිය හිමිකම් පෑම් සම්බන්ධයෙන් දණ්ඩනය.

16. (1) යම් හිමිකම් පෑමක හෝ විරෝධය පෑමක හෝ ඒ හා සම්බන්ධව පවත්වනු ලබන යම් විභාගයක දී හෝ අභියාචනයක දී දැනුවත්ව ම අසත්‍ය ප්‍රකාශයක් නැතහොත් ප්‍රකාශනයක් කරන සෑම තැනැත්තකු ම, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස්සියයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

(2) යම් ඉල්ලීමක්, හිමිකම් පෑමක්, විරෝධය පෑමක් නැතහොත් අභියාචනයක් සලකා බැලීමේ දී හෝ ඒ පිළිබඳව විභාග කිරීමේ දී යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරනු ලබන සාක්ෂි, සහතික කිරීමක් නැතහොත් දිවුරුම් දීමක් මත ඉදිරිපත් කළ යුතු යයි ලියාපදිංචි කිරීමේ නිලධරයකු නැතහොත් ප්‍රතිශෝධනය කිරීමේ නිලධරයකු විසින් නියම කරනු ලැබිය හැකි අතර, ඒ කාර්යය සඳහා සහතික කරවීම සහ දිවුරවීම ඔහු විසින් කරනු ලැබිය හැකි ය; තව ද එවැනි යම් සලකා බැලීමක දී නැතහොත් විභාගයක දී එවැනි ඉල්ලීමක, හිමිකම් පෑමක, විරෝධය පෑමක හෝ අභියාචනයක වලංගු භාවය කෙරෙහි වැදගත් වන කිසිවක්, අසත්‍ය බව දැන දැනම සහතික කරන්නා වූ නැතහොත් දිවුරුම් දෙන්නා වූ සෑම තැනැත්තකු ම, බොරු සාක්ෂි දීමේ වරදට වරදකරු විය යුතු අතර, දණ්ඩ නීති සංග්‍රහයෙහි ඒ සඳහා නියම කර ඇති දඬුවමට ඔහු යටත් විය යුතු ය.

සුදුසුකම් ලැබීමේ වැරදි ලිපිනය වෙනුවට සුදුසුකම් ලැබීමේ නිවැරදි ලිපිනය ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් ආදේශ කළ හැකි බව.

17. 14 වන වගන්තියේ (9) වන උපවගන්තිය යටතේ වූ යම් විභාගයක දී—

(අ) සුදුසුකම් ලැබීමේ වැරදි ලිපිනයක් යටතේ යම් තැනැත්තකුගේ නම නාම ලේඛනයක ඇතුළත් ව ඇති බවට ලියාපදිංචි කිරීමේ නිලධරයකු සෑහීමට පත් වන අවස්ථාවක, ඒ ලිපිනය වෙනුවට ඔහු විසින් නිර්ණය කරනු ලබන සුදුසුකම් ලැබීමේ නිවැරදි ලිපිනය, ඒ නාම ලේඛනයෙහි ඒ තැනැත්තාට අදාළ වන සටහනෙහි ඔහු විසින් ආදේශ කරනු ලැබිය හැකි ය; නැතහොත්

(ආ) යම් තැනැත්තකුගේ නම නාම ලේඛනයක ඇතුළත් කළ යුතුව තිබේ ද ඒ තැනැත්තාගේ සුදුසුකම් ලැබීමේ නිවැරදි ලිපිනය ඔහු විසින් හෝ ඔහු වෙනුවෙන් ඉදිරිපත් කර ඇති හිමිකම් පෑමෙහි සඳහන් ලිපිනය නොවන බව ලියාපදිංචි කිරීමේ නිලධරයකු සෑහීමට පත් වන අවස්ථාවක, ඒ තැනැත්තාගේ සුදුසුකම් ලැබීමේ ඒ නිවැරදි ලිපිනය ලෙස ඒ නිලධරයා විසින් නිර්ණය කරනු ලබන වෙනත් ලිපිනයක් යටතේ ඒ නිලධරයා විසින් ඒ තැනැත්තාගේ නම, ඒ නාම ලේඛනයෙහි ඇතුළත් කරනු ලැබිය හැකි ය.

ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් නාමලේඛනය සහතික කළ යුතු බව.

18. (1) හිමිකම් පෑම් හා විරෝධය පෑම් පිළිබඳව නිශ්චය කරනු ලැබූ විට හැකි පහසු ඉක්මණින් එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් ඒ මැතිවරණ කොට්ඨාසය සඳහා වූ නාම ලේඛනය සහතික කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද 15 වන වගන්තිය යටතේ යම් අභියාචනයක් විනිශ්චයට භාජනව පවතින කාලය තුළ ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් මේ වගන්තිය අනුව යම් නාම ලේඛනයක් සහතික කරනු ලැබිය හැකි අතර, ඉනික්බිති ඔහු විසින්, ඒ අභියාචනය පිළිබඳව තීරණය කරනු ලැබූ විට ප්‍රතිශෝධනය කිරීමේ නිලධරයාගේ තීරණය අනුව යම් තැනැත්තකුගේ නම ඒ සහතික කළ නාම ලේඛනයෙහි ඇතුළත් කළ යුතු ය; නැතහොත් එයින් ඉවත් කරනු ලැබිය යුතු ය.

(2) යම් නාම ලේඛනයක් සහතික කිරීමට පෙර, එහි කර ඇතැයි තමාට පෙනී යන යම් ලිපි දෝෂයක් නිවැරදි කිරීම, මේ පනතෙහි වූ කිසිවකින් ලියාපදිංචි කිරීමේ නිලධරයාට තහනම් වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

(3) යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා වූ නාම ලේඛනයක යම් ඉල්ලුම්කරුවකුට අදාළව පවත්නා සටහනක් නිවැරදි කිරීම සඳහා වූ ඉල්ලීමක්, ඒ කොට්ඨාසය සඳහා වූ නාම ලේඛනය සහතික කිරීමට පෙර, ඒ මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත කරනු ලැබිය හැකි ය. තව ද එවැනි යම් ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, ඒ සටහන ඉල්ලුම්කරුට අදාළ වන්නේ යයි ද, යම් කරුණක් සම්බන්ධයෙන් ඒ සටහන දෝෂ සහිත යයි ද නැතහොත් අසම්පූර්ණ යයි ද, තමා සුදුසු යයි සලකන යම් පරීක්ෂණයකින් පසුව ලියාපදිංචි කිරීමේ නිලධරයා හැඟීමට පත් වන්නේ නම්, ඔහු විසින් සටහනෙහි අවශ්‍ය සංශෝධනය කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

ලියාපදිංචි කිරීමේ සහ ප්‍රතිශෝධනය කිරීමේ නිලධරයන් විසින් කරනු ලබන දැන්වීම් සහ අඩාලව කල් තැබීම.

19. (1) ලියාපදිංචි කිරීමේ නිලධරයකු විසින් හෝ ප්‍රතිශෝධනය කිරීමේ නිලධරයකු විසින් හෝ කරනු ලැබීමට නියමිත සියලු දැන්වීම්, හිමිකම් පෑමේ දී නැතහොත් විරෝධය පෑමේ දී සඳහන් වී ඇති යම් ලිපිනයක් ඇත් නම් ඒ ලිපිනයට හෝ, එවැනි ලිපිනයක් සඳහන් කර නොමැති විට, නාම ලේඛනයෙහි සඳහන් ලිපිනයට හෝ ලියාපදිංචි කළ තැපැලෙන් යවන ලද නම්, එය ප්‍රමාණවත් දැනුම්දීමක් විය යුතු ය.

(2) මේ පනත යටතේ තමා ඉදිරියෙහි ඇති යම් විභාග කටයුත්තක් ලියාපදිංචි කිරීමේ නිලධරයකු හෝ ප්‍රතිශෝධනය කිරීමේ නිලධරයකු හෝ විසින් යම් පහසු වේලාවක සහ ස්ථානයක පැවැත්වීම පිණිස කලින් කල අඩාලව කල් තබනු ලැබිය හැකි ය.

නාමලේඛනය සහතික කළ බව දැන්වීම සහ එය ක්‍රියාත්මක වීම සහ බල පවත්නා කාලය.

20. (1) 18 වන වගන්තිය යටතේ යම් නාම ලේඛනයක් සහතික කරනු ලැබූ විට, ගැසට් පත්‍රයෙහි සහ එක් එක් ජාතික භාෂාවෙන් වූ යටත් පිරිසෙයින් එක් ප්‍රවෘත්ති පත්‍රයක හෝ දැන්වීමක් පළ කිරීමෙන් ඒ නාම ලේඛනය සහතික කර ඇති බවත් ඒ නාම ලේඛනය හෝ එහි පිටපතක් ලියාපදිංචි කිරීමේ නිලධරයාගේ කාර්යාලයෙහි හෝ දැන්වීමෙහි සඳහන් කරනු ලබන කොට්ඨාසය ඇතුළත වූ වෙනත් යම් ස්ථානයක හෝ දවසේ සියලු යුක්ති සහගත වේලාවල පරීක්ෂණය සඳහා තබා ඇති බවත් ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් දැනුම් දිය යුතු ය.

(2) යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා වූ සහතික කරන ලද නාම ලේඛනය, ඉහත කී පරිදි ගැසට් පත්‍රයෙහි දැන්වීම පළ කරන ලද දිනයෙහි බලාත්මක විය යුතු අතර 15(4) වන වගන්තිය හෝ 18 වන වගන්තිය හෝ අනුව පසු කාලයක දී කරනු ලබන යම් වෙනස් කිරීම් වුවහොත්, ඒවාට යටත්ව, සහතික කරන ලද ඊළඟ නාම ලේඛනය බලාත්මක වීමෙන් එය නිෂ්ප්‍රභ වන තෙක්, එය බලාත්මකව පැවතිය යුතු ය.

## V වන කොටස

### පොදු විධිවිධාන

21. (1) යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා, මේ පනත යටතේ පිළියෙළ කිරීමට හෝ ප්‍රතිශෝධනය කිරීමට නියමිත නාම ලේඛනයක්, අවශ්‍ය අවස්ථාවල සංගෘහිත කිරීමට සහ තබා ගැනීමට පහසු කොටස් සංඛ්‍යාවකින් සංගෘහිත කොට තබා ගනු ලැබිය හැකි ය. එවැනි කොටස් එකට ගත් කළ ඒ මුළු සංඛ්‍යාව ඒ මැතිවරණ කොට්ඨාසය සඳහා වූ නාම ලේඛනය ලෙස සලකනු ලැබිය යුතු ය. නාමලේඛනය සංගෘහිත කිරීම සහ එහි භාෂාව.

(2) යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා මේ පනත යටතේ පිළියෙළ කිරීමට හෝ ප්‍රතිශෝධනය කිරීමට නියමිත නාම ලේඛනයක්, (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, එක් එක් ජාතික භාෂාවෙන් වෙන වෙන ම සංගෘහිත කොට තබා ගනු ලැබිය යුතු ය.

22. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 වන ව්‍යවස්ථාවේ (ඉ), (ඊ), (උ), (ඌ), (එ) සහ (ඒ) ඡේදවල විධිවිධාන කිසිවක හේතුවෙන් ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි කරනු ලැබීම සඳහා අශක්‍යතාවකට යටත් හෙයින් යම් නාම ලේඛනයකින් නම ඉවත් කරනු ලැබූ යම් තැනැත්තකු ඒ අශක්‍යතාවට යටත්ව සිටීම අවසන් කරන අවස්ථාවක, යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා වූ නාම ලේඛනයෙහි තම නම ඇතුළත් කරවා ගැනීම සඳහා ඒ මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත, ඒ තැනැත්තා විසින් ලියවිල්ලකින් වූ ඉල්ලීමක් කරනු ලැබුවහොත්, සහ ඒ නාම ලේඛනයෙහි නම ඇතුළත් කර ගැනීම සඳහා ඒ තැනැත්තා සුදුසුකම් නොවන බවට ඒ ලියාපදිංචි කිරීමේ නිලධරයා සෑහීමට පත් වුවහොත්, ඒ තැනැත්තාගේ නම ඒ නාම ලේඛනයෙහි ඇතුළත් කරනු ලැබිය යුතු ය. ඒ නාම ලේඛනය මේ පනත යටතේ පිළියෙළ කිරීම, ප්‍රතිශෝධනය කිරීම නැතහොත් සහතික කිරීම, ඒ ඇතුළත් කිරීම කරනු ලබන අවස්ථාවේ දී සම්පූර්ණ කර තිබිය හැකි වුව ද, ඒ නම ඒ නාම ලේඛනයෙහි ඇතුළත් කිරීම බලසහිත විය යුතු ය. නාමලේඛනයෙන් ඉවත් කරන ලද නාම ඇතුළත් කිරීම.

23. (1) නාම ලේඛනයක් 10 වන වගන්තිය හෝ 18 වන වගන්තිය හෝ යටතේ තමා විසින් සහතික කරනු ලැබීමෙන් පසු හැකි තාක් ඉක්මණින්, සෑම ලියාපදිංචි කිරීමේ නිලධරයකු විසින් ම, ඒ නාම ලේඛනයෙහි නම් දැක්වෙන ඡන්ද හිමියන්ගේ මුළු සංඛ්‍යාව දැක්වෙන ප්‍රකාශයක්, ඒ සඳහා කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන යම් ආකෘතියක කොමසාරිස්වරයා වෙත සපයනු ලැබිය යුතු ය. ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් කොමසාරිස්වරයා වෙත නාම විස්තර සපයනු ලැබිය යුතු බව.

(2) යම් නාමයක් 15 වන වගන්තිය හෝ 22 වන වගන්තිය හෝ යටතේ නාම ලේඛනයෙහි ඇතුළත් කරනු ලැබූ අවස්ථාවක හෝ, යම් නමක් 15 වන වගන්තිය යටතේ ඒ නාම ලේඛනයෙන් ඉවත් කරනු ලැබූ අවස්ථාවක හෝ ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් ඒ නාම ලේඛනයෙහි නම් දැක්වෙන ඡන්ද හිමියන්ගේ මුලු සංඛ්‍යාව පිළිබඳ සංශෝධිත ප්‍රකාශයක්, ඒ සඳහා කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන යම් ආකෘතියක, කොමසාරිස්වරයා වෙත නොපමාව සපයනු ලැබිය යුතු ය.

කොමසාරිස්වරයාගේ බලතල හා කාර්ය.

24. (අ) ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පරිපාලන කාර්යය සම්බන්ධයෙන් පොදු විධාන කිරීම ද අධීක්ෂණය කිරීම ද කොමසාරිස්වරයා විසින් කළ යුතු ය;

(ආ) මේ පනතේ විධිවිධාන පලදායී ලෙස ක්‍රියාවෙහි යෙදවීමට වගබලා ගැනීම පිණිස අවශ්‍ය යයි කොමසාරිස්වරයා සලකන විධාන නියෝජ්‍ය සහ සහකාර මැතිවරණ කොමසාරිස්වරයන්ට, ලියාපදිංචි කිරීමේ නිලධරයන්ට සහ ඡන්ද හිමියන්ගේ නාම ලේඛන පිළියෙළ කිරීමේ සහ ප්‍රතිශෝධනය කිරීමේ කාර්ය සඳහා පත් කරන ලද වෙනත් නිලධරයන්ට නිකුත් කිරීමට කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය;

(ඇ) මේ පනතින් තමා වෙත පවරන ලද හෝ නියම කරන ලද වෙනත් සියලු බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටු කිරීම කොමසාරිස්වරයා විසින් කරනු ලැබිය යුතු ය.

තැනැත්තන් හෝ ස්ථාන පිළිබඳ සාවද්‍ය විස්තර.

25. මේ පනත යටතේ හෝ එහි කාර්ය සඳහා පිළියෙළ කරනු ලැබූ හෝ නිකුත් කරනු ලැබූ යම් නාම ලේඛනයක, ලැයිස්තුවක, දැන්වීමක නැතහොත් වෙනත් කවර හෝ ලේඛනයක නම් කර ඇති හෝ විස්තර කර ඇති යම් තැනැත්තකු හෝ ස්ථානයක් පිළිබඳ කිසිම මිථ්‍යාභාවයක් හෝ සාවද්‍ය විස්තරයක්, ඒ තැනැත්තා හෝ ස්ථානය හඳුනාගත හැකි වන පරිදි, ඒ නාම ලේඛනයෙහි, ලැයිස්තුවෙහි, දැන්වීමෙහි නැතහොත් ලේඛනයෙහි නම් කර හෝ විස්තර කර ඇත් නම්, මේ පනත ක්‍රියාත්මක වීම කෙරෙහි හෝ ඒ තැනැත්තා හෝ ස්ථානය සම්බන්ධයෙන් ඒ නාම ලේඛනයෙහි, ලැයිස්තුවෙහි, දැන්වීමෙහි නැතහොත් වෙනත් ලේඛනයෙහි වලංගුභාවය කෙරෙහි හෝ කිසිම ආකාරයකින් බලපෑමක් නොවිය යුතු ය.

දැන්වීම, නාම ලේඛන සහ වෙනත් ලේඛන පළ කිරීම.

26. (1) යම් දැන්වීමක්, නාම ලේඛනයක් හෝ වෙනත් ලේඛනයක් පළ කරන ලෙස මේ පනතින් නියමිතව ඇති අවස්ථාවක හා පළ කිරීමට නියමිත ක්‍රමයෙන් ප්‍රමාණවත් ප්‍රසිද්ධියක් ඒ දැන්වීමට, නාම ලේඛනයට හෝ වෙනත් ලේඛනයට නොලැබෙන බව ඒ දැන්වීම, නාම ලේඛනය හෝ වෙනත් ලේඛනය පළ කරන ලෙස නියම කරනු ලැබූ බලධරයාගේ මතය වුවහොත්, මේ පනතින් නියමිත පරිදි, ඒ දැන්වීම, නාම ලේඛනය හෝ වෙනත් ලේඛනය පළ කිරීමට අතිරේකව, ඒ දැන්වීම, නාම ලේඛනය හෝ වෙනත් ලේඛනය අදාළ මැතිවරණ කොට්ඨාසය ඇතුළත වූ ප්‍රකටව පෙනෙන ස්ථානවල ඒ දැන්වීමෙහි, නාම ලේඛනයෙහි හෝ වෙනත් ලේඛනයෙහි පිටපත් ප්‍රදර්ශනය කිරීම හෝ පරීක්ෂණය සඳහා තැබීම හෝ එයට ප්‍රසිද්ධිය ලබාදීම සඳහා අවශ්‍ය යයි තමා සලකන වෙනත් යම් පියවර ගැනීම හෝ ඔහු විසින් කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත අනුව ප්‍රදර්ශනය කරන ලද නැතහොත් පරීක්ෂණය සඳහා තබා ඇති යම් දැන්වීමක්, නාම ලේඛනයක් හෝ වෙනත් ලේඛනයක් නීත්‍යනුකූල බලයක් නොමැතිව විනාශ කරන, එහි කොටස් කපා හරින, විරූප කරන හෝ ඉවත් කරන නැතහොත් යම් දැන්වීමක්, නාම ලේඛනයක් හෝ වෙනත් ලේඛනයක් හෝ ඒවායේ පිටපත් ප්‍රදර්ශනය කිරීමට හෝ පරීක්ෂණය සඳහා තැබීමට අපොහොසත් වන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනහක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

ඉවත් කිරීම සහ අන්තර්කාලීන විධිවිධාන.

27. (1) 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ II වන කොටස සහ III වන කොටස මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) (1) වන උපවගන්තියෙහි විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, එකී රාජසභා ආඥාව යටතේ ප්‍රතිශෝධනය කරනු ලැබ මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව ම වූ දිනයෙහි බලාත්මකව පැවැති යම් ඡන්ද හිමි නාම ලේඛනයක්, මේ පනත යටතේ පිළියෙළ කොට සහතික කරන ලද ඡන්ද හිමි නාම ලේඛන බලාත්මක වන තෙක් බලාත්මකව පැවතිය යුතු ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 162 වන ව්‍යවස්ථාවෙහි සඳහන් අවස්ථානුගත කරුණු යටතේ ප්‍රථම මහා මැතිවරණය නියමිතව ඇති අවස්ථාවක, එහි ඒ මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් පාවිච්චි කළ යුතු ඒ ව්‍යවස්ථාවෙහි සඳහන් නාම ලේඛනය, ප්‍රථම පාර්ලිමේන්තුව විසුරුවා හරින ලද දිනයට පෙරාතුව ම වූ දිනයෙහි එකී රාජසභා ආඥාව යටතේ බලාත්මකව පැවති ඡන්ද හිමි නාම ලේඛන පදනම් කර ගෙන පිළියෙළ කරනු ලැබිය යුතු ය.

අත්හැරීම.

28. (1) නාම ලේඛනයක් ප්‍රතිශෝධනය කිරීම, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 10 වන වගන්තිය යටතේ ආරම්භ කර ඇත්තා වූ ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 97 වන ව්‍යවස්ථාව යටතේ ප්‍රකාශනය ප්‍රසිද්ධ කරන ලද දිනයෙහි එය අවසන් කර නොමැත්තා වූ ද අවස්ථාවක, ඒ ප්‍රතිශෝධනය කිරීම මේ පනතේ III වන කොටස යටතේ පිළියෙළ කරන ලද නාම ලේඛනයක ප්‍රතිශෝධනය කිරීමක් වූවාක් මෙන් ඒ ප්‍රකාශනය ප්‍රසිද්ධ කරනු ලැබූ විට, ඒ ප්‍රතිශෝධනය මේ පනතේ විධිවිධානවලට අනුකූලව තවදුරටත් කරගෙන ගොස් අවසන් කරනු ලැබිය යුතු ය. තව ද, ඒ අනුව ඒ ප්‍රතිශෝධනය කිරීමේ දී එකී රාජසභා ආඥාව යටතේ ගන්නා ලද යම් පියවරක්, මේ පනත යටතේ ගන්නා ලද පියවරක් ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 97 වන ව්‍යවස්ථාව යටතේ ප්‍රකාශනය ප්‍රසිද්ධ කරනු ලැබීමට පෙර පැවැති, යම් මැතිවරණ කොට්ඨාසයක් සම්බන්ධයෙන් වූ නාම ලේඛනයක් ප්‍රතිශෝධනය කිරීමට අදාළ යම් ලේඛනයක දැක්වෙන සෑම සඳහනක් ම, ඒ ප්‍රකාශනය ප්‍රසිද්ධ කරනු ලැබූ කල්හි, ඒ ප්‍රකාශනය ප්‍රසිද්ධ කරනු ලැබීමට පෙර පැවැති මැතිවරණ කොට්ඨාසය ඇතුළත් කරනු ලැබ ඇත්තේ ඒ ප්‍රකාශනයෙහි සඳහන් යම් අදාළ මැතිවරණ කොට්ඨාසයක ද ඒ අදාළ මැතිවරණ කොට්ඨාසය සම්බන්ධයෙන් වූ සඳහනක් ලෙස කියවා අර්ථ නිරූපණය කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

**29.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"මැතිවරණ කොමසාරිස්වරයා" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද මැතිවරණ කොමසාරිස්වරයා අදහස් වේ;

"ඡන්ද හිමියා" යන්නෙන්, මේ පනත යටතේ ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි කරනු ලැබීමට හිමිකම් ඇති තැනැත්තකු අදහස් වේ;

"මැතිවරණ කොට්ඨාසය" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 97 වන ව්‍යවස්ථාව යටතේ කරන ලද ප්‍රකාශනයක සඳහන් මැතිවරණ කොට්ඨාසයක් අදහස් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ යම් ගම් සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, සමාගම් ආඥාපනත යටතේ හැර, වෙනත් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද, ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ;

"ඡන්ද හිමි නාම ලේඛනය" යන්නෙන්, යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා වූ ඡන්ද හිමි නාම ලේඛනය අදහස් වේ; තවද

"ප්‍රතිශෝධනය කිරීමේ නිලධරයා" යන්න—

(අ) හිමිකම් පාන්නකු සම්බන්ධයෙන් යෙදෙන විට ඒ හිමිකම් පාන්නා පදිංචිව සිටින්නේ යම් දිසා අධිකරණයක අධිකරණ බලසීමාව ඇතුළත ද ඒ දිසා අධිකරණයේ දිසා විනිශ්චයකාරවරයා ඉන් අදහස් වේ;

(ආ) විරෝධය පාන්නකු සම්බන්ධයෙන් යෙදෙන විට, විරෝධය පෑමක් කරනු ලබන්නේ යම් තැනැත්තකුට විරුද්ධව ද ඒ තැනැත්තා පදිංචිව සිටින්නේ යම් දිසා අධිකරණයක අධිකරණ බලසීමාව ඇතුළත ද ඒ දිසා අධිකරණයේ දිසා විනිශ්චයකාරවරයා ඉන් අදහස් වේ.

## උපලේඛනය

### 'අ' ආකෘතිය

14 (1) වන වගන්තිය

**ඡන්ද හිමි නාම ලේඛනයෙහි තැනැත්තකුගේ නම ඇතුළත් කරවා ගැනීම හෝ කඩා ගනු ලැබීම සඳහා ඒ තැනැත්තා විසින් ම කරනු ලබන හිමිකම් පෑමේ ආකෘතිය**

................................ මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත ය.

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද හිමි නාම ලේඛනයෙන් අත් හැර ඇති*/ඉවත් කර ඇති* පහත දැක්වෙන මගේ නම ඒ නාම ලේඛනයෙහි ඇතුළත් කරවා ගැනීම*/කඩාගනු ලැබීම* සඳහා මම මෙයින් හිමිකම් පා සිටිමි.

මගේ හිමිකම් පෑම පිළිබඳ විස්තර පහත සඳහන් කරමි :—

(1) මගේ සම්පූර්ණ නම : ........................................................................
මහතා*/මහත්මිය*/මෙනෙවිය*.

(2) 19......ක්වූ ජූනි මස 1 වන දින මා සාමාන්‍යයෙන් පදිංචිව සිටි පුරුසකම් ලැබීමේ ලිපිනය—

(i) වරිපනම් අංකය :..............................

(ii) ගෘහ මූලික ලැයිස්තුවේ අංකය : ......................

(iii) වීදිය : ........................................................................

(iv) ගම*/නගරය*/වත්ත* : ........................................................

(v) තැපැල් කාර්යාලය : ........................................................

(vi) ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසය : .................................... ...........

(vii) උප දිසාපති කොට්ඨාසය : ........................................... ..........

(3) 19......ක්වූ ජූනි මස 1 වන දිනට වයස—

(i) අවුරුදු :............මාස : ...............

(ii) උපන් දිනය : ...................................

(4) වෙනත් යම් විස්තර :

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

(ඩ) (i) මා ශ්‍රී ලංකාවේ පුරවැසියකු බවත්—

(අ) පුරවැසි භාවය පිළිබඳ සහතිකයෙහි*/ලියා පදිංචි කිරීමේ සහතිකයෙහි*/ පුරවැසි භාවය පිළිබඳ වෙනත් ලියවිල්ලෙහි ;

(ආ) මා සන්තකයෙහි ඇති උප්පැන්න සහතිකයෙහි හා උප්පත්තිය සනාථ කිරීමේ වෙනත් ලියවිලිවල

අංකය හා දිනය ඇතුළුව අදාළ විස්තර :—

... ...............................................................................

...............................................................................

...............................................................................

...............................................................................

...............................................................................

බවත්,

(ii) 19.....ක් වූ ජූනි මස පළමුවන දිනයෙහි ඉහත (2) වන විෂයයෙහි සඳහන් ලිපිනයෙහි මා සාමාන්‍යයෙන් පදිංචිව සිටි බවත්,

(iii) ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයෙහි හෝ වෙනත් යම් මැතිවරණ කොට්ඨාසයක හෝ වෙනත් යම් ලිපිනයක් යටතේ ලියාපදිංචි කිරීම සඳහා හිමිකම් පෑමක් මා විසින් කර නොමැති බවත්

මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

ප්‍රකාශය

ඉහත සඳහන් හිමිකම් පෑම, සියලු විස්තර සම්බන්ධයෙන් සත්‍ය බවත් ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසය සඳහා ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි කරනු ලැබීමට මා සුදුසුකම් ලබා සිටින බවත් මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

.............................................................

හිමිකම් පාන්නාගේ අත්සන හෝ මාපට ඇඟිලි සලකුණ.

හිමිකම් පාන්නාගේ ලිපිනය :

...............................................................................

...............................................................................

...............................................................................

...............................................................................

දිනය : .............................................................

* අනවශ්‍ය වචන කපා හරින්න.

' අ ' ආකෘතිය

14 (2) වන වගන්තිය

**ඡන්ද හිමි නාම ලේඛනයෙහි තැනැත්තකුගේ නම ඇතුළත් කරවා ගැනීම හෝ තබා ගනු ලැබීම හෝ සඳහා ඒ තැනැත්තා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් කරනු ලබන හිමිකම් පෑමේ ආකෘතිය**

..............................මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත ය.

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද හිමි නාම ලේඛනයෙන් අත් හැර ඇති*/ ඉවත් කර ඇති* පහත දක්වෙන තැනැත්තාගේ නම ඒ නාම ලේඛනයෙහි ඇතුළත් කරවා ගැනීම*/තබා ගනු ලැබීම* සඳහා මම මෙයින් හිමිකම් පා සිටිමි.

මේ හිමිකම් පෑම පිළිබඳ විස්තර පහත සඳහන් කරමි :—

(1) ඒ තැනැත්තාගේ සම්පූර්ණ නම : ..............................................................
මහතා*/මහත්මිය*/මෙනෙවිය*

(2) 19......ක්වූ ජූනි මස 1 වන දින ඉහත නම සඳහන් තැනැත්තා පදිංචිව සිටි සුදුසුකම් ලැබීමේ ලිපිනය :—

(i) වරිපනම් අංකය : ..............................

(ii) ගෘහ මූලික ලැයිස්තුවේ අංකය : ........................

(iii) වීදිය : ..............................................................................

(iv) ගම*/නගරය*/වත්ත* :..............................................................

(v) තැපැල් කාර්යාලය : ......................................................

(vi) ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාසය : ..........................................

(vii) උප දිසාපති කොට්ඨාසය : ...................................................

(3) 19......ක්වූ ජූනි මස 1 වන දිනට වයස—

(i) අවුරුදු : .................. මාස : ..................

(ii) උපන් දිනය : ...................................

(4) වෙනත් යම් විස්තර :—

..............................................................................................

..............................................................................................

..............................................................................................

.......... ..................................................................................

..... ........................................................................................

(5) (i) මේ හිමිකම් පෑම කරනු ලබන්නේ යම් තැනැත්තකු වෙනුවෙන් ද ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියකු බවත් මා විසින් දරනු ලබන—

(අ) පුරවැසි භාවය පිළිබඳ සහතිකයෙහි*/ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි*/ පුරවැසි භාවය පිළිබඳ වෙනත් ලියවිල්ලක

(ආ) උප්පැන්න සහතිකයෙහි හා උප්පත්තිය ඔප්පු කිරීම සඳහා වූ වෙනත් ලේඛනවල

අංකය සහ දිනය ඇතුළුව අදාළ විස්තර :—

.................................................... ..............................

.................................................... ..............................

.................................................... ..............................

.................................................... ..............................

.................................................... ..............................  බවත්

(ii) මේ හිමිකම් පෑම කරනු ලබන්නේ යම් තැනැත්තකු වෙනුවෙන් ද ඒ තැනැත්තා, 19......ක්වූ ජූනි මස පළමුවන දිනයෙහි ඉහත (2) වන ශීර්ෂයෙහි සඳහන් ලිපිනයෙහි පදිංචිව සිටි බවත්,

(iii) මේ හිමිකම් පෑම කරනු ලබන්නේ යම් තැනැත්තකු වෙනුවෙන් ද ඒ තැනැත්තා, ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයෙහි හෝ වෙනත් යම් මැතිවරණ කොට්ඨාසයක වෙනත් යම් ලිපිනයක් යටතේ ලියාපදිංචි කිරීම සඳහා හිමිකම් පෑමක් කර නොමැති බවත්

මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

ප්‍රකාශය

ඉහත සඳහන් හිමිකම් පෑම, සියලු විස්තර සම්බන්ධයෙන් සත්‍ය බවත්, හිමිකම් පෑම කරනු ලබන්නේ යම් තැනැත්තකු වෙනුවෙන් ද ඒ තැනැත්තා, ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසය සඳහා ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි කරනු ලැබීමට සුදුසුකම් ලබා සිටින බවත් මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

......................................................
ඉල්ලුම්කරුගේ අත්සන හෝ මාපට ඇඟිලි සලකුණ.

ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය :—

......................................................

......................................................

......................................................

......................................................

......................................................

දිනය : ....................................

*අනවශ්‍ය වචන කපා හරින්න.

' ඇ ' ආකෘතිය

14(6) වන වගන්තිය

ඡන්ද හිමි නාම ලේඛනයෙහි නමක් ඇතුළත් කිරීම හෝ කපා හැරීම සම්බන්ධයෙන් විරෝධය පෑමේ ආකෘතිය

......................................................මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත ය. ,

මෙහි පහත විස්තර කරනු ලැබ ඇති තැනැත්තාගේ නම ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසය සඳහා වූ ඡන්ද හිමි නාම ලේඛනයෙහි ඇතුළත් කිරීම*/කපා හැරීම* සම්බන්ධයෙන් ..........................................................................................
......................................................වන මම මෙයින් විරෝධය පා සිටිමි.

විරෝධය පෑම කරනු ලබන්නේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තාගේ නාම ..........................................................................................

ඔහුගේ සුදුසුකම් ලැබීමේ ලිපිනය :..........................................................................................
..........................................................................................

(අවස්ථාවෝචිත පරිදි නාම ලේඛනයෙහි හෝ 'ආ' ලැයිස්තුවෙහි සඳහන් පරිදි මෙහි විස්තර දක්වන්න.)

ඡන්ද ප්‍රදේශයේ අක්ෂරය :.................

ඡන්ද කොට්ඨාසයේ අංකය :.................

ලියාපදිංචි කිරීමේ අංකය :.................

විරෝධය පෑමට හේතු : ..........................................................................................
..........................................................................................

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසය සඳහා වූ ඡන්ද හිමි නාම ලේඛනයෙහි*/' ආ ' ලැයිස්තුවෙහි මගේ නාම පහත දක්වෙන ආකාරයට සඳහන් වේ :—

නම : ..........................................................................................

සුදුසුකම් ලැබීමේ ලිපිනය :..........................................................................................
..........................................................................................

(අවස්ථාවෝචිත පරිදි නාම ලේඛනයෙහි හෝ 'ආ' ලැයිස්තුවෙහි සඳහන් පරිදි මෙහි විස්තර දක්වන්න.)

ඡන්ද ප්‍රදේශයේ අක්ෂරය : .................

ඡන්ද කොට්ඨාසයේ අංකය : .................

ලියාපදිංචි කිරීමේ අංකය :.................

..........................................................
විරෝධය පාන්නාගේ අත්සන හෝ මාපට ඇඟිලි සලකුණ.

දිනය : .................

දැනුම් දීම සඳහා විරෝධය පාන්නාගේ ලිපිනය : ..........................................................................................
..........................................................................................

*අනවශ්‍ය වචන කපා හරින්න.

'ඇ' ආකෘතිය

14(7) වන වගන්තිය

**හිමිකම් පාන්නකුගේ නම ඡන්ද හිමි නාම ලේඛනයෙහි ඇතුළත් කිරීම සම්බන්ධයෙන් විරෝධය පෑමේ ආකෘතිය**

.............................. මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙතය.

මෙහි පහත විස්තර කරනු ලැබ ඇති තැනැත්තාගේ නම, ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසය සඳහා වූ ඡන්ද හිමි නාම ලේඛනයෙහි ඇතුළත් කිරීම සම්බන්ධයෙන් .................................................. වන මම මෙයින් විරෝධය පා සිටිමි.

විරෝධය පෑම කරනු ලබන්නේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද

ඒ තැනැත්තාගේ නම : ..............................................................

ඔහුගේ සුදුසුකම් ලැබීමේ ලිපිනය : ..............................................................

..............................................................

විරෝධය පෑමට හේතු : ..............................................................

..............................................................

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසය සඳහා වූ ඡන්ද හිමි නාම ලේඛනයෙහි*/ "අ" ලැයිස්තුවෙහි* මගේ නම පහත දැක්වෙන ආකාරයට සඳහන් වේ :—

නම : ..............................................................

සුදුසුකම් ලැබීමේ ලිපිනය : ..............................................................

..............................................................

ඡන්ද ප්‍රදේශයේ අක්ෂරය : ..................

ඡන්ද කොට්ඨාසයේ අංකය : ..................

ලියාපදිංචි කිරීමේ අංකය : ..................

..............................................................
විරෝධය පාන්නාගේ අත්සන හෝ මාපට ඇඟිලි සලකුණ.

දිනය : ..................

දැනුම් දීම් සඳහා විරෝධය පාන්නාගේ ලිපිනය : ..............................................................

..............................................................

..............................................................

*අනවශ්‍ය වචන කපා හරින්න

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.